# පුරාවිද්‍යා ප්‍රවේශය

(විස්තෘත නව සංස්කරණය)



මහාචාර්ය එච්. ටී. බස්නායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ

# පුරාවිද්‍යා ප්‍රවේශය

(විස්තෘත නව සංස්කරණය)

මහාචාර්ය එච්. ටී. බස්නායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
675, පී. ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10.

ප්‍රථම මුද්‍රණය : 1992
දෙවන මුද්‍රණය : 2008

පුරාවිද්‍යා ප්‍රවේශය
(විස්තෘත නව සංස්කරණය)

© මහාචාර්ය එච්. ටී. බස්නායක
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ

ISBN 978-955-30-0691-4

පරිගණක කවර නිර්මාණය :
සදීශ්වර උදයංග

ප්‍රකාශනය:
එස්. ගොඩගේ සහ සහෝදරයෝ
675, පී. ද එස්. කුලරත්න මාවත,
කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
142, අවිස්සාවේල්ල පාර,
වැල්ලම්පිටිය.

## පෙරවදන

පුරාවිද්‍යාව යනුවෙන් අදහස් කෙරෙනුයේ පැරණි පුරාකෘති සොයා ගැනීමත්, සුපරීක්ෂාකාරී ව ඒවා විද්‍යාත්මක ලෙස විශ්ලේෂණය කිරීමත්, අනතුරු ව නිර්මාණශීලී අන්දමින්, අනුමාන ලබා ගැනීමත් ය. මේවා කෙතෙක් දුරට පැරණි මානව කථා පුවතකට අයත්දැයි අවබෝධ කර ගැනීමට අර්ථ නිරූපණය කිරීම ද වේ. මේ නිසා පුරාවිද්‍යාව ක්ෂේත්‍රයේ දී සිදුකරන භෞතික කාර්යයන් මෙන් ම රසායනාගාරයේ දී සිදුකරන බුද්ධිමය ක්‍රියාවලියකි. කෙසේ වෙතත් පුරාවිද්‍යාව, මානව විද්‍යාවටත්, ඉතිහාසයටත්, කෙතෙක් දුරට සම්බන්ධවීදැයි සොයා බැලීම මෙහි දී වැදගත් වේ. මානව සංහතියේ ඉතිහාසය මෙන් ම, සත්ත්වයන්ගේ භෞතික ලක්ෂණත්, මේ හැර, ජීව විද්‍යාත්මක නොවන ලක්ෂණත්, ඇතුළත් වූ සමස්තය සංස්කෘතිය නමින් හැඳින්වේ. මානව විද්‍යාඥයකු වූ එඩ්වඩ් ටයිලර් (Edward Tylor) දක්වන අන්දමට සහභාගිත්වය යන්න සාමාන්‍ය අදහසට අනුව දැනීම, විශ්වාසය කලාව, ආචාර ධර්ම, නීතිය, ඇවතුම් පැවතුම්, කාර්යශූරතා, හා වෙනත් සමාජමය අවශ්‍යතා වශයෙන් මිනිසා ලබාගන්නා සියලු ම දෑ ලෙස දක්වා තිබේ. එසේ ම ඇතැම් මානව විද්‍යාඥයන් සභ්‍යත්වය යන්න මීට වඩා සංක්ෂිප්ත අර්ථයකින් දක්වා තිබේ. සමාජයක පවතින ජීව විද්‍යාත්මක නොවූ ලක්ෂණ ද ඊට ඇතුළත් කොට තිබේ. එබැවින් මානව වංශ විද්‍යාව (Anthropology) යනු පුළුල් විෂයය ධාරාවකි. මේ අනුව එය භෞතික මානව විද්‍යාව (Physical Anthropology) සංස්කෘතික හෝ සමාජ මානව විද්‍යාව (Cultural or Social Anthropology) හා පුරාවිද්‍යාව (Archaeology)

යනුවෙන් කොටස් තුනකට බෙදා වෙන්කර තිබේ. එනම් භෞතික මානව විද්‍යාව (ඊට ජීව විද්‍යාත්මක මානව විද්‍යාව යනුවෙන් ද හඳුන්වයි) මඟින් අධ්‍යයනය කෙරෙන්නේ මානව ජීව විද්‍යාත්මක හෝ භෞතික ලක්ෂණ හා ඒවා කෙසේ සැකසුනේ ද යන්න පිළිබඳ ව යි. සංස්කෘතිකමය මානව විද්‍යාව හෙවත්, සමාජ මානව විද්‍යාව මඟින් විශ්ලේෂණය කෙරෙන්නේ, මානව සංස්කෘතිය හා මානව සමාජය යි. සංස්කෘතික මානව විද්‍යාව මඟින් වැදගත් උප අධ්‍යයන ක්ෂේත්‍ර දෙකක් ඉස්මතු වේ. එනම්, මානව වංශ ශාස්ත්‍රය (Ethnography) (එනම්, සජීවී සංස්කෘතීන් තනි ව අධ්‍යයනය කිරීම) හා මානව වංශ විද්‍යාව (Ethnology) (එනම්, මානව වංශ සාධක උපයෝගී කොට ගෙන විවිධ සංස්කෘතීන් සංසන්දනාත්මක ව හැදෑරීම වේ.) ඉන් මානව සමාජයේ පවත්නා සාමාන්‍ය මූලධර්මතාවයන් සොයාගත හැකි වේ.)

අවසාන විෂයය ධාරාව පුරාවිද්‍යාව යි. සංස්කෘතික මානව වංශ විද්‍යාඥයන්, සමකාලීන සමාජයන්හි පවත්නා ජීවන රටා, පදනම් කරගෙන, සමාජ අධ්‍යයනයන් කරන අතර, පුරාවිද්‍යාඥයන් භෞතික අවශේෂයන් පදනම් කරගෙන පැරණි සමාජයන් පිළිබඳ අධ්‍යයනය කරයි. මෙහි දී භෞතික අවශේෂයන් යනුවෙන් අදහස් කරනුයේ පැරණි සමාජයන් විසින් භාවිත කරනු ලැබූ ගොඩනැගිලි මෙවලම් උපකරණ හා වෙනත් පුරාකෘතීන් ය.

කෙසේ වෙතත් පුරාවිද්‍යාඥයන්ට පැවරී ඇති අභියෝගාත්මක කාර්යභාරය වී තිබෙන්නේ පුරාභාණ්ඩ අතුරෙන්, භෞතික සංස්කෘතිය අර්ථකථනය කිරීම යි. නිදසුනක් වශයෙන් හමු වී ඇති වළං හා වෙනත් උපකරණ කෙබඳු ආකාරයකින් පැරණි සමාජයන්හි භාවිත වී ද? සමහර නිවාස කවාකාර වන අතර සමහරක් චතුරාශ්‍රාකාර වූයේ මන්ද? පුරාවිද්‍යාඥයන් මෑත දශක කීපය තුළ දී, මානව වංශ පුරාවිද්‍යාවක් ගොඩනගාගෙන තිබේ. ඉන්, උත්සාහ දරා ඇත්තේ, පැරණි භාණ්ඩ නිර්මාණය කිරීමේ දී හෝ භාවිත කිරීමේ දී පැරණි සමාජ ක්‍රියාකාරිත්වය කුමන ආකාරයක් ගත්තේ ද යන්න සොයා බැලීම යි.

පුරාවිද්‍යාඥයාට අතීතය ගොඩනැංවීමේ දී බලපා තිබෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ අසම්පූර්ණ කැඩී බිඳී ගිය, මූලික ස්වරූපය නොදන්නා, වෙනස්කම්වලින් ගහණ පුරාවිද්‍යාත්මක සාධක පරිශීලනය කරමින් අතීතය ගොඩනගා ගැනීම යි.

මානව චර්යාවේ නිරීක්ෂණය කළ නොහැකි අසම්පූර්ණ සාධක මඟින් මානව චර්යාක්‍රම, නිරීක්ෂණය කිරීමේ දුෂ්කර ශික්ෂණ ක්‍රමයක් ලෙස පුරාවිද්‍යාව හඳුන්වයි.

"පුරාවිද්‍යා ප්‍රවේශය" යන මෙම කෘතියට අන්තර්ගත කොට තිබෙන්නේ පුරාවිද්‍යාවේ දී අනුගමනය කළ යුතු සංකල්ප ප්‍රතිපත්ති මූලධර්ම හා සිද්ධාන්ත මාලාවකි. මීට පෙර ප්‍රකාශයට පත්කරන ලද පුරාවිද්‍යා ප්‍රවේශය ග්‍රන්ථයේ ම විස්තෘත නව සංස්කරණයක් බව මෙහි ලා සඳහන් කළයුතු වේ. එසේ ම මෙම කෘතිය පුරාවිද්‍යා විෂයය හදාරණ ආධුනිකයන්ට අත්පොතක් වශයෙන් භාවිත කිරීමට හැකිවන පරිදි සරල භාෂාවෙන් රචනා කොට ඉදිරිපත් කර තිබේ. පුරාවිද්‍යාව පිළිබඳ උනන්දුවක් දක්වන පාඨකයන්ට ද මෙය පිටිවහලකි. සාමාන්‍යයෙන් පුරාවිද්‍යාව හැඳින්වීම, එහි විෂයය ස්වරූපය, පුරාකෘති හඳුනාගැනීම හා අර්ථකථනය පුරාවිද්‍යාත්මක භූමි හඳුනාගැනීම හා ගවේෂණය කළ යුතු ආකාරය, කැණීම් ක්‍රම භාවිතය හා පුරාවිද්‍යාත්මක දත්ත අනාවරණය කර ගැනීමේ හා අර්ථ නිරූපණය කිරීමේ ක්‍රමවේදයන්, පුරාවිද්‍යාත්මක සාධක හා කාලනිර්ණ විධික්‍රම යනාදියත්, පුරාවිද්‍යාත්මක සංරක්ෂණය පිළිබඳ මූලික අවබෝධයකුත් මෙහි දී ලබාදීමට අපේක්ෂා කෙරේ. ප්‍රථම මුද්‍රණයේ පැවති අඩුපාඩු හැකිතාක් සම්පූර්ණ කරමින්, විස්තෘත සංස්කරණයක් ලෙස දෙවැනි මුද්‍රණය එළි දැක්වීමට නියමිතයි.

මෙහි දෙවැනි සංස්කරණය කිරීමට අපව අනේක වාරයක් උනන්දු කරවන ලද්දේ පාඨකයන් විසිනි. එසේ හෙයින් ඔවුන් සියලු දෙනාට ම මෙහි දී ස්තුති වන්ත වෙමු.

එසේ ම මෙකී ග්‍රන්ථය පසුගිය වසර කිහිපය තුළ දී පාඨකයන් අතට පත්වීමෙන් පසු එහි අඩුපාඩුකම් අපට දැනීගිය බැවිනුත්,

විෂයය හදාරන්නන් හට සිංහල පොත්වල ඇති අඩුපාඩුකම් හැකිතාක් දුරට සම්පූර්ණ වී ඇති බව ප්‍රායෝගික ව අත්දුටු හෙයිනුත්, මෙසේ නව සංස්කරණයක් කිරීමට අපේක්ෂා කළෙමු.

මේ කෘතිය මුද්‍රණ ද්වාරයෙන් මුද්‍රණය කිරීමේ දී සහාය දුන් දේශබන්ධු සිරිසුමන ගොඩගේ මහතාටත් අපගේ නොමඳ කෘතඥතාවය හිමි වේ. මීට අමතර ව අපට සෑම අවස්ථාවක දී උපකාර කරමින් අප දිරි ගැන්වූ ප්‍රින්සි බස්නායක මහත්මියට හා කීර්ති තොටබද්දගේ මහතාට ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි.

මහාචාර්ය එච්. ටී. බස්නායක
3M/27, ජාතික නිවාස,
කිරිබත්ගොඩ,
කැලණිය.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදා හෙට්ටිගේ
පුරාවිද්‍යා අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.